# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2309/34 - 2022 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා සිවිල් ගුවන්
සේවා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

අවසන් වරට 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගවලින් සංශෝධිත, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු) නියෝග පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 2 වන නියෝගයේ -

2(3) උප නියෝගයට වහාම පහළින් පහත දැක්වෙන නව උප නියෝගය ඇතුළත් කිරීම මඟින් ඃ-

"2(4) මෙම නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළට (යා.ජා.ගු) ගොඩබසින විධිමත් කාල සටහන්ගත සෑම ජාත්‍යන්තර ගුවන්යානාවක් සඳහා ම, එකී ගුවන් තොටුපළ වෙත සිය මෙහෙයුම් ආරම්භ කරන දිනයේ සිට පළමු මාස හය (06) සඳහා ගොඩබෑසීම් හා නැවතුම් ගාස්තුවලට අදාළව 50% ක වට්ටමක් හිමි විය යුතු ය".

EOG 12-0137

1A - PG 5429— 356 (2022/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*